මගේ අංකය - 10028/MDTU/LT/PG/01/01

කළමණාකරණ සංවර්ධන හා පුහුණු අංශය,

2022.05.25

සියළු නිළධාරීන් වෙත,

<u>කාර්යක්ෂමතා කඩයිමක් ලෙස පශ්චාත් උපාධිය හැදෑරීම අවශ්‍ය වන නිලධාරීන් සඳහා ප්‍රතිපාදන</u>

දෙපාර්තමේන්තුවෙහි කාර්ය මණ්ඩලය අතරින් සිය කාර්යක්ෂමතා කඩයිම් අවශ්‍යතාවක් ලෙස පශ්චාත් උපාධි පාඨමාලා හැදෑරිය යුතු නිළධාරීන් හට එම පාඨමාලා ගාස්තු හෝ ඉන් කොටසක් පවතින ප්‍රතිපාදන තත්වය මත දෙපාර්තමේන්තුව මගින් ගෙවීමට හැකියාව ඇත. ඒ සඳහා අයදුම් කිරීමට බලාපොරොත්තු වන්නේ නම්, 2022.06.10 දිනට පෙර අදාල ලේඛන පිටපත් ද සමඟ අතිරේක සර්වේයර් ජනරාල් (මධ්‍යම) වෙත එවීමට කටයුතු කරන ලෙස දන්වමි. (ඊමේල් - snrssmdtu@survey.gov.lk)

02. පාඨමාලා ගාස්තු වාරික වශයෙන් ගෙවීමේ හැකියාව ඇත්නම් එම තොරතුරු ද ඒ සමගම එවිය යුතුය.

03. මෙය 2022 වර්ෂයේ ආරම්භ කරන ලද පාඨමාලා සඳහා පමණක් අදාල වේ.

04. පවතින ප්‍රතිපාදන ප්‍රමාණය හා දැනට පවතින කාර්ය මණ්ඩලය සමානුපාතිකව බලා පාඨමාලා ගාස්තු ගෙවනු ලබන නිලධාරීන් සංඛ්‍යාව අතිරේක සර්වේයර් ජනරාල් (මධ්‍යම) මගින් තීරණය කරනු ඇත.

05. දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ පාඨමාලා ගාස්තු ලබා ගැනීමේ දී අදාල නිලධාරීන් විසින් පහත කරුණු වලට එකඟ විය යුතුය.

5.1. ඒකාබද්ධ සේවාවන්හි නිලධාරීන් මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත වාර්තා කළ දිනය හා දෙපාර්තමේන්තුවෙහි සේවය කළ කාලය පිළිබඳ විස්තර ලබා දිය යුතු අතර, පශ්චාත් උපාධි පාඨමාලාව හැදෑරීමෙන් පසු වසර 03 ක අනිවාර්ය කාලයක් මෙම දෙපාර්තමේන්තුවෙහි සේවය කිරීමට එකඟ විය යුතුය.

5.2. එසේම දෙපාර්තමේන්තු නිළධාරීන් පාඨමාලාව හැදෑරීමෙන් ලබා ගන්නා දැනුම දෙපාර්තමේන්තු අවශ්‍යතා සඳහා යොදා ගැනීමට සිදු වන අවස්ථා වලදී ඒ සඳහා අවශ්‍ය සහය ලබා දිය යුතුය.

5.3. පාඨමාලා හදාරන සියළු නිලධාරීන් නියමිත කාල සීමාව තුල පාඨමාලාව සම්පූර්ණ කිරීමෙන් පසු අදාල විශ්ව විද්‍යාලය මගින් නිකුත් කරනු ලබන සහතිකයේ සත්‍ය පිටපතක් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී (කළමණාකරණ සංවර්ධන හා පුහුණු) වෙත යොමු කිරීමට කටයුතු කල යුතුය.

5.4. එසේම පාඨමාලාව සම්පූර්ණ කිරීමට අපොහොසත් වුවහොත්, දෙපාර්තමේන්තු ප්‍රතිපාදන වලින් ගෙවන ලද පාඨමාලා ගාස්තුව අදාල නිලධාරියාගේ වැටුපෙන් අය කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

ඒ.දිසානායක
සර්වේයර් ජනරාල්

ඒ. දිසානායක
සර්වේයර් ජනරාල්
සර්වේයර් ජනරාල් කාර්යාලය
කොළඹ 05.